GMOA
ESTABLISHED IN 1926
TU No. 291
THE GOVERNMENT MEDICAL OFFICERS' ASSOCIATION
No.275/75, Professional Centre, Prof. Stanley Wijesundara Mawatha, Colombo 07
Tel : 2580886 / 0714 999555
Fax : 4518668 / 2503586
Web : www.gmoa.lk
Email : info@gmoa.lk
office@gmoa.lk

2013/12/30

# මාධ්‍ය නිවේදනයයි

ශීඝ්‍රයෙන් ඉහල යමින් පවතින වකුගඩු රෝගීන් සංඛ්‍යාව සෞඛ්‍ය සේවා පවත්වා ගෙන යාමේදී බරපතල අර්බුදයක් බවට පත් වී ඇත. මේ නිසා මේ සම්බන්ධව සෞඛ්‍ය අමාත්‍යංශයේ වැඩි අවධානයක් යොමු කල යුතු බවටත් ඒ සඳහා නිශ්චිත ඒකකයක් පිහිටුවා ක්‍රියාමාර්ග ගත යුතු බවටත් රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය පෙන්වා දී ඇත.

මෙම රෝගය වලක්වා ගැනීමටත් එය පාලනය කිරීම සඳහාත් ගත යුතු ක්‍රියාමාර්ග ඇතුලත් දොලොස් වැදෑරුම් වැඩ පිලිවෙලක් අප සංගමය විසින් අතිගරු ජනාධිපතිතුමාට භාරදී ඇත. එහිදී මෙම රෝගය සම්බන්ධව නිශ්චිත නිරීක්ෂණ වැඩ පිලිවෙලක්, සහිතව සියලුම අමාත්‍යාංශවල ඒකාබද්ධතාවයෙන් යුක්තව සෞඛ්‍ය අමාත්‍යනාංශයේ බෝ නොවන ඒකකය යටතේ ක්‍රියාත්මක කිරීමේ වැදගත්කම පෙන්වා දුනිමු.

තත්ත්වය මෙසේ තිබියදී ජාතික විද්‍යා පදනම මගින් ( National Science Foundation) කෝටි 35 ක් වැය කොට මෙම රෝගයට නිධානය සෙවීමේ තවත් පර්යේෂණයක් ආරම්භ කිරීමට යෝජනා කර ඇති බව මීට සම්බන්ධ මහචාර්යවරයෙකු අපට දැනුම් දී ඇත. මීට පෙර අවස්ථා ගණනකදීද කෝටි ගණන් වියදම් කොට රෝග නිධානය සෙවීමේ පර්යේෂණ ගණනක් පවත්වා ඇතත් රෝගය සම්බන්ධව නිශ්චිත රෝග නිධානයක් සොයා ගැනීමට හෝ නිශ්චිත වැඩ පිලිවෙලක් ඉදිරිපත් කිරීමට සියලු පාර්ශව අසමත් වී ඇත. මේ අනුව මෙම කෝටි 35ක මහජන මුදල්ද තවත් නාස්තියක් වීමේ අවදානමක ඇත. මේ නිසා මෙම සියලු පර්යේෂණ හා වැඩ පිලිවෙලවල් සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ තිබෙන අනෙකුත් අමාත්‍යාංශ සම්බන්ධීකරණය කරන ඒකකයක් මගින් සිදු කල යුතු බවටත් එසේ නොවන්නේනම් මහජන මුදල් අපතේ යෑම දිගින් දිගටම සිදුවන නිසා

1. මෙම ජාතික විද්‍යා පදනම මගින් සිදු කිරීමට යන පර්යේෂණය වහාම අත්හිටුවන ලෙසත්
2. ඒ සඳහා වෙන් කල මුදල් සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ බෝ නොව ඒකකයට වෙන්කොට මෙම සමස්ථ ක්‍රියාවලිය මෙම ඒකකය යටතේ ක්‍රියාත්මක කරන ලෙසත්

මුදල් අමාත්‍යාංශයේ ලේකම් ආචාර්ය පී.බී ජයසුන්දර මහතගෙන් ඉල්ලා සිටිමට රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය තිරණය කර ඇත.

එසේ නොවන්නේ නම් දිගින් දිගටම විවිධ පුද්ගලයින් හා ආයතන මෙම වකුගඩු රෝගය යොදා ගෙන මුදල් නාස්ති කිරීම අවම කිරීමට හෝ රෝගය පාලනය කිරිමට නොහැකි වනු ඇති බවට රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය තරයේ විශ්වාස කරයි.

මෙම පර්යේෂණ සඳහා මුදලට නොවිකෙණ පුද්ගලයින් යොදා ගැනිම රටේ සහ මහජනතාවට වඩාත් හිතකර වනු ඇතැයි අප අදහස් කරන්නෙමු. මෙම පිරිස් සමග එක්ව කටයුතු කිරීම සඳහා විශේෂිත කමිටුවක් රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය මගින් මේ වන විටත් ස්ථාපිත කොට ඇත. ඒ අනුව කටයුතු කිරීමෙන් ඵලදායි සහ කාර්යක්ෂම ලෙස මෙම රෝගය සඳහා වූ නිශ්චිත ක්‍රියාමාර්ගය ගැනිමට හැකි වනු ඇත.

ස්තූතියි

වෛද්‍ය සමන් අබේවර්ධන
ලේකම්

වැඩිදුර විස්තර :

වෛද්‍ය නවීන් සොයිසා - 0718582444
වෛද්‍ය නලින්ද හේරත් - 0717876516
වෛද්‍ය තිමති වික්‍රමසේකර - 0772003062